**සවියෙන් පෙරට - අපි එකට**

**e - ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
| --- | --- | --- | --- |
| 11 | ඉතිහාසය | 2 | 4. බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම් |

සැකසුම - වයි.ඩී.ප්‍රියදර්ශනී

බප/හො/පැල්පොල ක.වි.

# 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට බලපෑ හේතු

**1815 වර්ෂයෙන් පසු බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු ලංකාව පාලනය කිරිමේ දී ආදායමට වඩා ලංකාවේ වියදම ඉහළ ගියේය..ඒ නිසා ඒ පිළිබඳ සොයා බැලිමට1829 විලියම් මැක්බින් කෝල්බෲක් නැමැත්තා ව යටත් විජිත ලේකම් විසින් පත් කරනු ලැබිය.**

ආර්ථිකය පිළිබඳ සොයා බැලීමට

↓

විලියම් කොල්බෲක්ද (1929) පැමිණ ඇත.

අධිකරණය හා නීතිමය තත්වය


↓

චාල්ස් හේ කැමරන්ද (1930)


# බ්‍රිතාන්‍ය ජාතිකයන් අපේ රටට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

- 1883 කොල්බෲක් ප්‍රතිසංස්කරණය
- 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය
- 1910 මැනිං ප්‍රතිසංස්කරණය
- 1924 මැනිං ඩොවෙන්ෂර් ප්‍රතිසංස්කරණය
- 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය
- 1947 සොල්බරි ප්‍රතිසංස්කරණය


# 1833 කෝල්බෘක් ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන ලක්ෂණ




# ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම



# 1833 ව්‍යවස්ථාදායක සභාව



# 1833 කොල්බෲක් ප්‍රතිසංස්කරණයේ අවාසි



කොල්බෲක් ප්‍රතිසංස්කරණය සංශෝධන කරන ලෙසට මුල්වරට උද්ඝෝෂණ කරන ලද්දේ ව්‍යවස්ථාදායකයට තේරී පත් වූ යුරෝපා ජාතිකයන් තිදෙනාය.

* ඔවුන්ගේ ඉල්ලීම වන්නේ වතුවගාවට අවශ්‍ය යටිතල පහසුකම් ලබාගැනීමයි.


*එයට හේතුව වූයේ ඒ සඳහා මුලදී මුදල් වෙන් කිරිමට කටයුතු නොකිරිමයි.

# විධායක සභාව

- යටත් විජිත ලේකම්
- භාණ්ඩාගාරික
- ගණකාධිකාරී
- මිනුම්පති
- කොළඹ රේගු අයකැමි

ආණ්ඩුකාරවරයා සතු මුදල් බලය සීමා කිරීම.

# යුරෝපා ජාතීන් විසින් කොල්බෘක් යෝජනාවල යම් යම් සංශෝධන සිදු කර ගැනීමට උද්ඝෝෂණ ආරම්භ කිරිමට බල පෑහේතු



# උද්ඝෝෂණ පැවැත්වූ ආකාරය හා ප්‍රතිඵල

- ව්‍යවස්ථාදායක සභාව තුළ ප්‍රශ්න ඇසීම
- යෝජනා ඉදිරිපත් කිරීම
- පුවත්පත්වලට ලිපි සැපයීම
- උද්ඝෝෂණ මෙහෙය වීමට සංවිධාන පිහිටුවීම
- උදා - ජෝර්ජ් වෝල් ගේ නායකත්වයෙන් 1865 දී ලංකා සංගමය පිහිටුවීම

→

1889 දී ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සංඛ්‍යාව 8 දක්වා වැඩි කිරීම
මුස්ලිම් 01 හා උඩරට සිංහල 01

# 1910 ප්‍රතිසංස්කරණ හා පසුබිම

## ලාංකික මධ්‍යම පාන්තිකයන්ගේ ඉල්ලීම්

- 1908 දෙසැම්බර් මාසයේදී ජේම්ස් පීරිස් මහතා විසින් ලංකාවට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය බවට විධිමත් පෙත්සමක් යටත් විජිත ලේකම්වරයාට ඉදිරිපත් කිරීම
- පහතරට නිෂ්පාදන සංගමය,හලාවත සංගමය,යාපනය සංගමය වැනි සංගම් මගින් පෙත්සම් ඉදිරිපත් කිරීම

# යටත් විජිත ලේකම්වරයාට පෙත්සම් ඉදිරිපත් කළ ජේම්ස් පීරිස් මහතා




# පෙත්සම් මගින් ශ්‍රී ලාංකිකයන් ඉල්ලා සිටි ඉල්ලීම්

- ව්‍යවස්ථාදයක සභාවේ නිල නොලත් සාමාජික පිරිස ඉහල දැමීම.
- වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම.
- පළාත් බද නියෝජන ක්‍රමය අනුව ඒ ඒ පළාත් වෙනුවෙන් ඡන්ද බලයෙන් නියෝජිතයන් තෝරා ගැනීමට ඉඩ සැලසීම.
- ව්‍යවස්ථාදයක සභාවේ බලතල වැඩි කිරීම.

# එහි ප්‍රතිඵල

- 1910 නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් හඳුන්වා දීමයි.
- මෙරට ආණ්ඩුකාරවරයා වූ හෙන්රි මැකලම්ගේ නිර්දේශ පදනම් කරගෙන යටත් විජිත ලේකම් වරයා වූ කෲව් සාමිවරයා සැලසුම් කළ කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය හඳුන්වා දෙන ලදී.

# 1910 ප්‍රතිසංස්කරණය ව්‍යවස්ථාදායක සභාව



# කෝල්බෲක් මැකලම් ප්‍රතිසංස්කරණයේ ලක්ෂණ

1. • ව්‍යවස්ථාදායක සභාවට ප්‍රථම වරට ඡන්ද බලයෙන් නියෝජිතයන් පත් කිරීමට ඉඩ ලැබීම

2. • උගත් ලාංකිකයන් වෙනුවෙන් එක් නියෝජිතයකු එම සභාවට පත් වීම

3. • තව දුරටත් නිලලත් පිරිස බහුතරයක් වීම

# අමද්‍යප ව්‍යාපාර ආරම්භ වූයේ ඇයි?

1910 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ලාංකිකයන්ගේ ඉල්ලීම් ඉටු නොවීම

1912 දී රජය විසින් රා තැබෑරුම් පිහිටුවීමට අවසර ලබා දෙමින් සුරාබදු පනතක් පැනවීම

# අමද්‍යප උද්ඝෝෂණයේ කැපී පෙනෙන ලක්ෂණ


- ❖ රජයේ සුරාබදු ප්‍රතිපත්තියට එරෙහිව මහජන මතයක් ඇති කිරීමට උත්සාහ දැරීම.
- ❖ මධ්‍යම පන්තික ඉංග්‍රීසි උගතුන් හා ආගමික පුනරුදයේ ක්‍රියාකාරිකයන් යන දෙකොටසම එක අරමුණකින් කටයුතු කිරීම.
- ❖ කොළඹ මධ්‍යම අමද්‍යප සභාවක් පිහිටුවා රට පුරා ශාඛා ආරම්භ කර අමද්‍යප සමිති ජාලයක් ගොඩ නැගීම.
- ❖ අමද්‍යප වේදිකාවේ දී ආණ්ඩුවේ කටයුතු විවේචනය වීම.

# ඉන්දියානු ජාතික ව්‍යාපාරයේ ආභාසය

- 19 වන සියවස වන විට ලංකාව මෙන්ම ඉන්දියාවද බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීම
- 1885 වර්ෂයේ ඉන්දියානු නායකයන් බ්‍රිතාන්‍යය රජයට විරුද්ධව උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කිරීම
- එම උද්ඝෝෂණ නිසා ලංකාවට වඩා ඉදිරියට ගිය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉන්දියාවට හඳුන්වා දීමට බ්‍රිතාන්‍ය පාලකයෝ කටයුතු කළහ.

# ඉන්දියානු ජාතික ව්‍යාපාරය පණ පෙවීමට නායකත්වය දුන් නායකයෝ

- ❑ මහත්මා ගාන්ධි
- ❑ සුරේන්ද්‍රනාත් බැනර්ජි
- ❑ බාල් ගංගාධාර්
- ❑ තිලක්
- ❑ ජවහල්ලාල් නේරු



- ඉන්දියාවේ නිදහස් සටනේ ආභාෂය අපේ රටට ද ලැබුණි.

# ලංකා ජාතික සංගමය

- බිහිවුයේ ඇයි?

1

1915 දී ඇති වූ සිංහල මුස්ලිම් කෝලාහල අවස්ථාවේ දී යුද්ධ නීති පැනවීම

2

පාලන කටයුතුවල ද වැඩි බලතල ලබා ගැනීමට

3


බ්‍රිතාන්‍ය අණ්ඩුව විසින් ජනතාව මර්දනය කිරිමට කටයුතු කිරීම

# ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපති

පොන්නම්බලම් අරුණාචලම්



# 1920 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය



# ලක්ෂණ

1

- ව්‍යවස්ථාදායක සභාවේ මුල්වරට නිල නොලත් බහුතරයක් ඇති වීම


2

- පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම

3

- වාර්ගික නියෝජනය තවදුරටත් පැවතීම

# මැනිං ඩොවෙන්ෂර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය 1924



# කැපී පෙනෙන ලක්ෂණ


- මහජන ඡන්දයෙන් පත් නිල නොලත් වූ පිරිස බහුතරයක් වීම.

- බලය හා වගකීම වෙන් කළ ආණ්ඩුක්‍රමයක් වීම.

# ඩොනමෝර් ආණ්ඩුක්‍රමය 1931

ඩොනමෝර් සාමිවරයාගේ ප්‍රධානත්වයෙන් යුතු ඩොනමෝර් කොමිසම විසින් හඳුන්වා දුන් මෙම ප්‍රතිසංස්කරණය මඟින් ලාංකිකයන්ට සැලකිය යුතු දේශපාලන වගකීම් පැවරිණි.

# ව්‍යවස්ථාදායක සභාව



# ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ

රාජ්‍යමන්ත්‍රණ සභාව

සර්වජන ඡන්ද බලය

විධායක කාරක සභා ක්‍රමය

ආණ්ඩුකාවරයා හා රාජ්‍ය නිලධාරීන්

# සර්වජන ඡන්ද බලය

1912 ව්‍යවස්ථාදායක සභාවට නියෝජිතයන් තේරීමේ දී ඡන්ද බලය හිමි වුයේ සීමිත පිරිසකටය.
ඡන්දදායකු වීමට නම්
අධ්‍යාපනය
දේපල
හා පුරුෂයින්ට
පමණ ඡන්ද බලය හිමි විය.

1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය දී **අවුරුදු 21ට වැඩි ස්ත්‍රී පුරුෂ සියලු පුරවැසින්ට** ඡන්ද බලය හිමිවිය.

# විධායක කාරක සභා ක්‍රමය

- මීට පැවති ප්‍රතිසංස්කරණ වලදී ව්‍යවස්ථාදායක හි විධායකය අතර සබදතා දුරස් විය.
- නමුත් මෙම ප්‍රතිසංස්කරණයෙන් ව්‍යවස්ථාදායක කටයුතු වලට මෙන්ම විධායක කටයුතු සඳහා බලයක් හිමිවිය.
- ඒ ඒ කාරක සභාවේ සභාපතිවරයා ඒ ඒ විෂය භාර ඇමතිවරයා විය.
- ලාංකිකයන්ගේ අවශ්‍යතාවන්ට ගැලපෙන ආකාරයට අමාත්‍යාංශ මෙහෙය වීමට ඇමතිවරුන්ට හැකිවිය.
- උද- ගොවිජනපද ව්‍යාපාරය

  නිදහස් අධ්‍යාපනය හදුන්වා දීම

ස්වදේශ කටයුතු

කෘෂිකර්ම සහ ඉඩම්

පළාත් පාලන

සෞඛ්‍ය

අධ්‍යාපන

ගමනාගම හා පොදු වැඩ

කම්කරු කර්මාන්ත හා වෙළඳාම

# ආණ්ඩුකාරවරයා හා රාජ්‍ය නිලධාරීන්

- ආණ්ඩුකාරවරයා

රාජ්‍ය නිලධාරින්

ආණ්ඩුකාරවයාගේ බලය බොහෝ දුරට අඩු විය. රාජ්‍ය මන්ත්‍රණ සභාව හා ඇමති මණ්ඩලය සමග සහයෝගයෙන් කටයුතු කළ යුතු විය.

රාජ්‍ය ආරක්ෂාව ,මුදල් කටයුතු හා නීති කටයුතු වැනි වැදගත් අංශ රාජ්‍ය නිලධාරීන් තිදෙනාට පැවරීම දුර්වලතාවයකි.

# නිදහස සඳහා උද්ඝෝෂණ

- ආණ්ඩුකාරවරයා ගේ බලතල සීමා කර තිබීමත්, රාජ්‍ය නිලධාරීන්ට පවරා තිබූ අමාත්‍යාංශ ලාංකික ඇමතිවරුන්ට පැවරීම අවශ්‍ය බවත් දක්වමින් උද්ඝෝෂණ කළහ.

රාජ්‍ය මන්ත්‍රණ සභාව හා ඇමතිවරු , වාමාංශික නායකයන් යන සියළු දෙනාම පෙරමුණ ගෙන ක්‍රියා කළහ.

# පොපි මල් ව්‍යාපාරය ආරම්භ වීම

පළමුවන ලෝක මහා සංග්‍රාමයෙන් ආබාධිත බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ට හා පවුලවලට ආධාර එකතු කර ගැනීම සඳහා පොපිමල් ව්‍යාපාරය ආරම්භ විය.

නොවැම්බර් 11 වන දින යුද්ධ සාමදාන දිනය ලෙස සලකා සෑම වසරකම එදිනට පොපි මල් විකිණීම සිදු කෙරුණි.

පෙළපාලි හා උත්සව පවත්වමින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය කෙරෙහි පක්ෂපාතීත්වය පෙන්වීමට කටයුතු කෙරුණි.

පොපිමල් විකිණීමෙන් ලැබෙන මුදල් බ්‍රිතාන්‍යට යවනු ලැබීය.

# සූරිය මල් ව්‍යාපාරය

1926 වර්ෂයේ දී ලංකාවේ සේවා මුක්ත භට සංගමය විසින් පොපි මල් විකිණීම සිදු කළ දින සිට සූරිය මල් විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කළහ.
පසුව වාමාංශික නායකයෝ සූරිය මල් ව්‍යාපාරයට සම්බන්ධ විය.
සූරිය මල් විකිණීමෙන් ලැබෙන මුදල් මෙරට දුප්පත් ජනතාවගේ ශුභ සිද්ධියට වැයකෙරුණි.

- 1935 දී ලංකා සමසමාජ පක්ෂය පිහිටුවාගත් ආචාර්ය ඇන්.ඇම්.පෙරේරා, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා වැනි වාමාංශික නායකයෝ නිදහස උදෙසා කළ උද්ඝෝෂණවල ප්‍රචාරක කටයුතු සඳහා සූරිය මල් ව්‍යාපාරය යොදා ගත්හ.

පොපිමල් → වහල් බවේ සංකේතයක්

සූරිය මල් → නිදහසේ සංකේතයක්

**ලෙස සලකා නිදහස සඳහා උද්ඝෝෂණවල ප්‍රචාරක ව්‍යාපාරයක් බවට පත් විය.**

# 1947 සොල්බරි ප්‍රතිසංස්කරණය

- 1939 වර්ෂයේ දෙවන ලෝක මහා සංග්‍රාමය ආරම්භ වීම නිසා යුද්ධ අවස්ථාවේදී බ්‍රිතාන්‍යයන්ට ලංකාවේ සහයෝගය අවශ්‍ය විය.
- යුද්ධය නිම වූ පසුව ලාංකිකයන්ට නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ලබා දෙන මෙන් ඉල්ලා සිටියහ.
- ඒ අනුව 1947 දී ලාංකියන් වන අපට සෝල්බරි ප්‍රතිසංස්කරණය හිමි විය.

# ලක්ෂණ

- අග්‍රාණ්ඩුකාර ධූරය
- ද්වී මණ්ඩල පාර්ලිමේන්තුව
- අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය

**සවියෙන් පෙරට අපි එකට**
**e- ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| **11** | **ඉතිහාසය** | **2** | **4. බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම් - ඇගයීම** |

**සැකසුම: වයි.ඩී.ප්‍රියදර්ශනී**
**බප/හො/පැල්පොල ක.වි.**

01) බ්‍රිතාන්‍යයන් අපේ රටට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන්නේ ඇයි?

02) බ්‍රිතාන්‍යයන් මෙරටට හඳුන්වා දුන් ප්‍රථම ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක්ද?

03) එහි ලක්ෂණ තුනක් ලියන්න.

04) 1833 දී ව්‍යවස්ථාදායක සභාවට තේරී පත් වූ යුරෝපා ජාතීන් ඉල්ලීම් දිනා ගැනීමටඅනුගමනය කළ දේවල් මොනවාද?

05)පහත වගුව සම්පූර්ණ කරන්න.

| වර්ෂය | ප්‍රතිසංස්කරණය | ලක්ෂණ |
|---|---|---|
| 1833 | කෝල්බෲක් ප්‍රතිසංස්කරණය | |
| 1910 | කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය | |
| 1920 | මැනිං ප්‍රතිසංස්කරණය | |
| 1924 | මැනිං ඩෙවොන්ෂර් ප්‍රතිසංස්කරණය | |
| 1931 | ඩොනමෝර් ප්‍රතිසංස්කරණය | |
| 1947 | සෝල්බරි ප්‍රතිසංස්කරණය | |

06 ) පොපිමල් ව්‍යාපාරය ආරම්භ වුයේ කුමක් නිසාද?

07) සූරිය මල් ව්‍යාපාරයෙන් ප්‍රතිලාභ හිමි වුයේ කාහටද?

සවියෙන් පෙරට අපි එකට

*e*- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 11 | ඉතිහාසය | 2 | 4. බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම් - පිළිතුරු |

සැකසුම: - වයි.ඩී.ප්‍රියදර්ශනී

බප/හො/පැල්පොල ක.වි.

01) බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර වරු ලංකාව පාලනය කිරිමේ දී ආදායමට වඩා ලංකාවේ වියදම ඉහළ යාම

02) 1833 හඳුන්වා දුන් කෝල්බෲක් ප්‍රතිසංස්කරණයයි.

03) * දිවයින පළාත් 5කට බෙදීම

* අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම

* උඩරට පහතරට ඒකාබද්ධ කොට පාලනය කිරීම

04) * ප්‍රශ්න ඇසීම

* යෝජනා ඉදිරිපත් කිරීම

* පුවත්පත් වලට ලිපි සැපයීම

* උද්ඝෝෂණ මෙහෙයවීම

05)

| වර්ෂය | ප්‍රතිසංස්කරණය | ලක්ෂණ |
|---|---|---|
| 1833 | කෝල්බෲක් ප්‍රතිසංස්කරණය | * දිවයින පළාත් 5කට බෙදීම<br>* අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම<br>*උඩරට පහතරට ඒකාබද්ද කොට පාලනය කිරීම |
| 1910 | කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය | * ව්‍යවස්ථාදායක සභාවට ප්‍රථම වරට ඡන්ද බලයෙන් නියෝජිතයන් පත් කිරීමට ඉඩ ලැබීම<br>* උගත් ලාංකිකයන් වෙනුවෙන් එක් නියෝජිතයකු එම සභාවට පත් වීම |
| 1920 | මැනිං ප්‍රතිසංස්කරණය | * පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම<br>* වාර්ගික නියෝජනය තවදුරටත් පැවතීම |
| 1924 | මැනිං ඩෙවොන්ෂර් ප්‍රතිසංස්කරණය | * මහජන ඡන්දයෙන් පත් නිල නොලත් වූ පිරිස බහුතරයක් වීම<br>* බලය හා වගකීම වෙන් කළ ආණ්ඩුක්‍රමයක් වීම |
| 1931 | ඩොනමෝර් ප්‍රතිසංස්කරණය | * සර්ව ජන ඡන්ද බලය<br>* විධායක කාරක සභා ක්‍රමය<br>* ආණ්ඩුකාරවරයා හා රාජ්‍ය නිලධාරීන් |
| 1947 | සෝල්බරී ප්‍රතිසංස්කරණය | * ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව<br>*ආණ්ඩුකාර ධූරය වෙනුවට අග්‍රාණ්ඩුකාර ධූරය හඳුන්වාදීම |

06)පළමුවන ලෝක යුද්ධයෙන් ආබාධිත බ්‍රිතාන්‍ය ආබාධිත සොල්දාදුවන්ට හා පවුල්වලට

ආධාර එකතු කර ගැනීමට

07)මෙරට දුප්පත් ජනතාවගේ ශුභ සිද්ධිය උදෙසා